# ආගමන සමයේ සිව්වන ඉරුදින

## පළමුවන දේව ප්‍රකාශනය 2 සාමුවෙල් 7: 1–6 ඒ, 8–11, 16

*සාමුවෙල්ගේ දෙවන පොතෙන් උපුටා ගත් කොටසකි.*

ස්වාමීන් වහන්සේ දාවිත්ගේ වංශය සදහටම ස්ථිර කරන සේක.

දාවිත් රජුගේ සියලු සතුරන්ගෙන් සමිඳාණන් වහන්සේ ඔහුට හැම අතින් ම නිදහස දුන් පසු, ඔහු සිය නිවසෙහි වාසය කළේ ය. එසේ සිටින අතර, රජතුමා නාතාන් නම් දිවැසිවරයාට කතා කොට, "මෙන්න, මම දැන් කිහිරි ගෙයක වසමි. එහෙත් දෙවියන් වහන්සේගේ ගිවිසුම් කරඬුව තවමත් කූඩාරමක් ඇතුළේ තිබේ ය"යි කීවේ ය. එවිට නාතාන් පිළිතුරු දෙමින්, "ඔබ ගොස් ඔබේ සිතේ තිබෙන සියල්ල කරන්න. මන්ද, සමිඳාණන් වහන්සේ ඔබ සමඟ වැඩ සිටින සේකැ" යි රජුට කීවේ ය.

තවද, එම රාත්‍රියේ සමිඳාණන් වහන්සේගේ පණිවුඩය නාතාන් වෙත පැමිණියේ ය. උන් වහන්සේ මෙසේ වදාළ සේක. "තුඹ ගොස්, සමිඳාණන් වහන්සේ මෙසේ කියන සේකැ යි මගේ මෙහෙකරුවන දාවිත්ට කියන්න. 'මාගේ වාසස්ථානය සඳහා මට මාළිගාවක් ගොඩනගන්නට යන්නේ තුඹ ද? මාගේ සෙනඟ වන ඉශ්රායෙල් කෙරෙහි අධිපතියා වන පිණිස තණ බිමෙන් ද බැටළුවන් පස්සේ යාමෙන් ද මම තුඹ කැඳවාගතිමි. තුඹ ආ ගිය හැමතැන්හිම මම තුඹ සමඟ සිට තුඹේ සතුරන් තුඹ ඉදිරියෙහි සිඳ දැමුවෙමි. මිහිපිට සිටින උත්තමයන්ගේ නාමය මෙන් උසස් නාමයක් තුඹට සලසා දෙන්නෙමි. මාගේ සෙනඟ වන ඉශ්රායෙල් ඔවුන්ට ම හිමි ස්ථානයෙහි වාසය කරමින්, තවත් බැහැර කරනු නොලබන ලෙස මම ඔවුන්ට ස්ථානයක් නියම කොට ඔවුන් ස්ථිර කොට පිහිටුවන්නෙමි. දුෂ්ඨයෝ පෙර කළා සේ තවත් ඔවුන්ට හිරිහැර නොකරන්නාහ. එසේ කරන්නේ මා ඉශ්රායෙල් කෙරෙහි විනිශ්චයකාරයන් පත් කළ කාලයේ දී මෙන් ය. තුඹේ සියලු සතුරන්ගෙන් නිදහස ලැබෙන්නට සලස්වන්නෙමි. ඇරත්, සමිඳාණන් වහන්සේ තුඹට වංශයක් උපදවා දෙන බව සමිඳාණන් වහන්සේ ම තුඹට දන්වන සේක. තුඹේ වංශයද රාජශ්‍රීය ද මා ඉදිරියෙහි සදහට ම ස්ථිර කරනු ලබන්නේ ය. තුඹේ සිංහාසනය සදහට ම පිහිටුවනු ලබන්නේ ය.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 89: 1–4, 26, 28

**පිළිතුර:** සමිඳුනි, ඔබේ තිරපෙම ගැන මම සදහට ම ගයන්නෙමි.

**ගීය :** සමිඳුනි, ඔබේ තිර පෙම ගැන මම සදහට ම ගයන්නෙමි.
ඔබේ විශ්වාසවන්තකම පරපුරෙන් පරපුරට පවසන්නෙමි.
ඔබේ තිර පෙම සදහට ම පවතින බව මම ඒකාන්තයෙන්ම පිළිගනිමි.
ඔබේ විශ්වාසවන්තකම අහස මෙන් තිරසර බව මම දනිමි.

ඔබ මෙසේ වදාළ සේක.
"මා තෝරා ගත් තැනැත්තා සමඟ මම ගිවිසුමක් කළෙමි.
මාගේ සේවක දාවිත්ට මම මෙසේ දිවුළෙමි.
මම ඔබේ පෙළපත සදහට ම පිහිටුවන්නෙමි.
පරපුරෙන් පරපුරට ඔබේ සිහසුන ගොඩනගන්නෙමි."

ඔහු මට මොර ගසමින්
"ඔබ මාගේ දෙවිඳාණෝ ය. මාගේ පියාණෝ ය.
මාගේ ආරක්ෂක පර්වතයාණෝ ය."යි කියන්නේ ය.
මම ඔහුට සදහට ම ප්‍රේම කරන්නෙමි.
ඔහු උදෙසා මාගේ ගිවිසුම ස්ථිර ව පවත්නේ ය.

## දෙවන දේව ප්‍රකාශනය රෝම 16: 25–27

*පාවුළු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.*

### කල්පාන්තරයන්හි සැඟවී තිබූ අභිරහස දැන් එළිදරව් වේ.

දෙවියන් වහන්සේට මහිමය වේ වා! ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ පණිවුඩය හා මා දේශනා කළ සුබ අස්න අනුව ද දීර්ග යුගයන්හි සැඟවී තිබී දැන් එළිදරව් කොට ඇති අභිරහස අනුව ද ඔබ ඇදහිල්ලෙහි ස්ථිර ලෙස පිහිටුවීමට උන් වහන්සේ පොහොසත් වන සේක. දැන් වනාහී ඒ අභිරහස දිවැසිවරයන්ගේ

ලියැවිලිවලින් අනාවරණය කර ඇත. සියල්ලන් ම අදහා කීකරු වන පිණිස සදාතන දෙවියන් වහන්සේගේ ආඥාවෙන් එය සකල ජාතීන්ට ප්‍රකාශ කොට ඇත. සකල ප්‍රඥාවෙන් යුක්ත වූ අසමසම දෙවියන් වහන්සේට ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ කරණකොටගෙන සදහට ම මහිමය වේ වා! ආමෙන්.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද ලූක් 1 : 38

ආලේලූයා! ආලේලූයා!
බලන්න, මම සමිඳාණන්ගේ දාසිය වෙමි.
ඔබ පැවසූ ලෙස මට ඉටු වේ වා
ආලේලූයා!

## සුවිශේෂය ලූක් 1 : 26–38

*ලූක් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

### ඔබ පිළිසිඳගෙන පුතකු ලබන්නෙහි ය.

සවැනි මස, ගාබ්‍රියෙල් නම් දේව දූතයා දෙවියන් වහන්සේ විසින් ගලීලයේ නාසරෙත් නම් නුවර විසූ, දාවිත් රජ පරපුරෙන් පැවත එන ජෝශප් නම් මනුෂ්‍යයෙකු හට විවාහ ගිවිසුම් දී සිටි කන්‍යාවක වෙත යවන ලදි. ඒ කන්‍යාවගේ නම මරියා ය. දේව දූතයා, ඇය සිටි තැනට පැමිණ, "විපුල ප්‍රසාද ලත් උත්තමිය, ඔබට මංගල වේ. සමිඳාණන් වහන්සේ ඔබ සමඟ ය"යි කී ය. එහෙත්, ඈ ඒ වදන් අසා අතිශයින් කැළඹී මේ කෙබඳු ආචාරයක් දැ යි සිත සිතා සිටියා ය. දේව දූතයා ඇට කතා කොට, "මරියාවෙනි, බිය නොවන්න. ඔබ දෙවියන් වහන්සේගෙන් වරප්‍රසාද ලද්දෙහි ය. මේ බලන්න, ඔබ පිළිසිඳගෙන පුතෙකු ලබන්නෙහි ය.

උන් වහන්සේට 'ජේසුස්' යන නාමය තබන්න. උන් වහන්සේ ශ්‍රේෂ්ඨ වන සේක. 'පරමෝත්තමයාණන්ගේ පුත්‍රයාණෝ' යයි කියනු ලබන සේක. උන් වහන්සේගේ පියවූ දාවිත්ගේ සිංහාසනය දෙවි ස්වාමින් වහන්සේ උන් වහන්සේට ප්‍රදානය කරන සේක. උන් වහන්සේ ජාකොබ්ගේ වංශය කෙරෙහි සදහටම රජකම් කරන සේක. උන් වහන්සේගේ රාජ්‍යය කෙළවරක් නොදක්නේ ය" යි කී ය.

එවිට මරිය තුමී දේව දූතයාට කතා කොට, "මට පුරුෂයකු නැති බැවින් මෙවැන්නක් කෙසේ සිදු විය හැකි දැ" යි ඇසුවා ය. දේව දූතයා ඇට උත්තර දෙමින්, "ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ කෙරෙහි පහළ වන සේක. පරමෝත්තමයාණන්ගේ අනුහාවය ද ඔබ වසා ගන්නේ ය. එහෙයින් උපදින පරිශුද්ධ දරුවා 'දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ ය'යි කියනු ලබන සේක. බලන්න, ඔබේ ඥාතිවරිය වන එලිසබෙත් ඇගේ මහලු වයසේ දී පුතෙකු පිළිසිඳ ගත්තා ය. වඳ යයි කියන ලැබූ ඇයට දැන් සවැනි මාසය ය. මක්නිසාද, දෙවියන් වහන්සේට නොකළ හැකි කිසිවක් නැතැ" යි කීවේ ය. මරිය තුමී කතා කරමින්, "බලන්න, මේ මම ස්වාමීන් වහන්සේගේ දාසිය වෙමි! ඔබ පැවසූ ලෙස ම මට සිදු වේවා" යි කීවා ය. එවිට දේව දූතයා ඇ කෙරෙන් වෙන් ව ගියේ ය.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*